# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල


| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973 (HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 430 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 |
| දිනය<br>திகதி<br>Date | 11/03/2024<br>පැය 1545 | | |

## මාධ්‍ය නිවේදනය

### ගාල්ල උඩුගම ශ්‍රී ශාසනාලංකාරාරාම විහාරස්ථානයේ ශ්‍රී මහා බෝධිරාජ පෙරහර – රථවාහන ගමනාගමනය සීමා කිරීම සම්බන්ධව

ගාල්ල උඩුගම ශ්‍රී ශාසනාලංකාරාරාම විහාරස්ථානය මඟින් පවත්වනු ලබන ශ්‍රී මහා බෝධිරාජ පෙරහර 2024.03.09 වන දින සිට 2024.03.12 වන දින දක්වා පැවැත්වෙන අතර අවසන් රන්දෝලි පෙරහර මාර්තු මස 12 වන දින පැවැත්වීමට නියමිතව ඇත.

අවසන් රන්දෝලි පෙරහර 2024.03.12 වන දින රාත්‍රී 07.00 ට ඉහත විහාරස්ථානයෙන් ආරම්භ වී ශ්‍රී ගුණානන්ද මාවත ඔස්සේ ගාල්ල උඩුගම ප්‍රධාන මාර්ගයට පිවිස බාර් හංදිය දක්වා ගමන් කර නැවත බාර් හංදියේ සිට එම මාර්ගය ඔස්සේම විහාරස්ථානය දක්වා වීථි සංචාරය කිරීමට නියමිතව ඇත.

ඒ අනුව පෙරහර පැවැත්වෙන කාල සීමාව තුල ගාල්ල උඩුගම මාර්ගයේ පෙරහර ගමන් කිරීමට නියමිත කොටසේ රථවාහන ගමනාගමනය සීමා කරන අතර එම කාලය තුළ පහත විකල්ප මාර්ග භාවිතා කරන ලෙස පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටී.

**01. හිනිදුම දෙස සිට ගාල්ල දෙසට ගමන් කරන රථ වාහන.**

- හිනිදුම දෙස සිට ගාල්ල දෙසට ගමන් කරන රථවාහන උඩුගම පොලිස් ස්ථානය අසල හෝමදොල හංදියෙන් වමට ඇති අකුරැස්ස බංගම පාර ඔස්සේ බංගම දෙසට කිලෝමීටර් 08 ක් පමණ ගමන් කර බංගම පොලිස් වසමෙන් දකුණට ඇති අළුත්වත්ත මාර්ගයේ අළුත්වත්ත හංදියෙන් ගාල්ල හිනිදුම ප්‍රධාන මාර්ගයට පිවිසීමට හැකියාව ඇත.

**02. ගාල්ල දෙස සිට හිනිදුම දෙසට ගමන් කරන රථ වාහන.**

- ගාල්ල දෙස සිටි හිනිදුම දෙසට ගමන් කරන රථවාහන අළුත්වත්ත හංදියෙන් දකුණට ඇති බංගම මාර්ගය ඔස්සේ බංගම දෙසට ගමන් කර බංගම අළුත්වත්ත හංදියෙන් වමට ඇති බංගම අකුරැස්ස මාර්ගයෙන් වමට හෝමදොළ හන්දිය දක්වා ගමන් කර හිනිදුම ගාල්ල ප්‍රධාන මාර්ගයට පිවිසීමට හැකියාව ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**